# <u>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දෙහිවල</u>
# <u>කෘෂිකර්ම නිලධාරී</u>

1. ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුව පැවැත්වීම සඳහා සහය වීම, වාර්තා සැකසීම හා කමිටුව සඳහා අවශ්‍ය තොරතුරු රැස්කොට ප්‍රාදේශීය ලේකම් වෙත හා අනෙකුත් නිලධාරීන්ට ලබාදීම.
2. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා අවශ්‍ය තොරතුරු හා වාර්තා රැස්කොට ප්‍රාදේශීය ලේකම් වෙත හා අනෙක් නිලධාරීන්ට ලබාදීම.
3. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව ඇතුළු මාසික රැස්වීම් සඳහා සහභාගී වී කෘෂිකර්ම අමාත්‍යංශය නියෝජනය කිරීම හා එහිදී පැනනැගෙන කෘෂිකර්ම සංවර්ධනයට අදාළ ගැටළු සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ දැනුවත් කිරීම.
4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්න රැස්වීම සඳහා සහභාගී වීම හා එහිදී ගනු ලබන තීරණ සම්බන්ධයෙන් දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ දැනුවත් කිරීම.
5. ගොවිජන සේවා කමිටු රැස්වීම් සඳහා සහභගී වීම හා එහිදී පැන නැගෙන ගැටළු සම්බන්ධයෙන් දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ දැනුවත් කිරීම.
6. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී, කෘෂිකර්ම උපදේශක, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වැනි නිලධාරීන් සමග මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම මගින් කෘෂිකර්ම සංවර්ධන කටයුතු ඒකීය වැඩසටහනක් ලෙස පවත්වා ගෙන යාම.
7. ප්‍රාදේශීය කාෂිකර්ම සංවර්ධන වැඩසටහන්වල සාර්ථකත්වයන් හා එයට බලපානු ලබන හේතු හඳුනා ගෙන ඒවා ආයතනගත කිරීමට ක්‍රියාමාර්ග ගැනීම.
8. එමෙන්ම එම වැඩසටහන්වල පසුබෑම හා ඒවාට බලපාන හේතු හඳුනා ගෙන ඒවා මගහරවා ගැනීමට අදාළ ආයතන සමඟ ක්‍රියාමාර්ග ගැනීම.
9. ප්‍රාදේශීය ලේකම් කොටඨාසයේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ දත්ත එක්රැස් කිරීම, නිරවද්‍යතාවය තහවුරු කිරීම හා යාවත්කාලීන කරන ලද තොරතුරු දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂට, අමාත්‍යංශයේ සංඛ්‍යාලේඛන අංශයට, අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) අංශයට හා අදාළ අනෙකුත් අංශවලට ලබාදීම.
10. ජාතික කෘෂිකාර්මික තොරතුරු පද්ධතිය (NAIS) යාවත්කාලීන කර පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය මට්ටමේ සහාය ලබාදීම.
11. භෝග පුරෝකථන වාර්තා සැකසීමට සහය වීම.
12. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කාබනික පොහොර නිෂපාදනය හා භාවිතය පිළිබඳ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය සහය ලබාදීම හා පොහොර බෙදා හැරීමේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමට පොහොර අමාත්‍යංශයට අනුයුක්ත කොට ඇති සහකාර අධ්‍යක්ෂකවරුන්ට සහය වීම.
13. කෘෂිකර්ම අමාත්‍යංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලබන හා කෘෂිකර්ම අමාත්‍යංශය යටතේ ඇති ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන්වලට අදාළ ව නියමිත ඉලක්කයන් අනුව ක්‍රියාත්මක කිරීම සහ රේඛීය අමාත්‍යංශ/දෙපාර්තමේන්තු/ ආයතන, පුද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජා සංවිධාන සමඟ ඒවාට සහය ලබා දීම.
14. ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් හා ගොවි සංවිධාන සමඟ කාර්යක්ෂම සන්නිවේදනයක් සඳහා තොරතුරු පද්ධතියක් පවත්වා ගෙන යමින් ඔවුන්ගේ ගැටළු විසදීමට අදාළ පාර්ශව සමඟ කටයුතු කිරීම.
15. ආපදා තත්ත්වයන්හීදී වගාවන්ට සිදුවන හානි සඳහා ආධාර හා සහන ලබාදීමට ප්‍රාදේශීය ලේකම්ට සහ දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂට සහය ලබාදීම.
16. ප්‍රදේශයේ කෘෂිකර්ම වගාබිම් ආශ්‍රිතව පවත්නා කෘෂිකාර්මික විභවයන් හා ප්‍රවණතාවන් සහ ප්‍රදේශයට ගැළපෙන භෝග වර්ග හඳුනාගැනීම හා වගා කටයුතු සැලසුම් කිරීමට ප්‍රාදේශීය ලේකම්ට සහය වීම.
17. කෘෂිකාර්මික වගාබිම් ආශ්‍රිතව පවත්නා කෘෂිකාර්මික සංවර්ධනයට ඇති බාධා හා ඒවාට බලපා ඇති හේතු හඳුනා ගෙන ඒවා මගහරවා ගැනීමට අදාළ ආයතන සමඟ ක්‍රියාමාර්ග ගැනීම.
18. ප්‍රාදේශීය කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය නිෂ්පාදන ඉලක්ක සැකසීමට දායකත්වය ලබාදීම.

19. නියමිත ප්‍රමිතියෙන් යුතු බීජ, රෝපණ ද්‍රව්‍ය හා අනෙකුත් සේවාවන් නියමිත  වේලාවට සැපයීමේ කටයුතු සම්බන්ධීකරණය.
20. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත නව තාක්ෂණය ගොවි ජනතාව වෙත කාර්යක්ෂමව සම්ප්‍රේෂණය කිරීම සඳහා අදාළ ආයතන සමඟ ක්‍රියාමාර්ග ගැනීම.
21. පාසල් සිසුන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට නැඹුරු කරලීමේ වැඩසටහන් සහ පාසල් ගෙවතු වගා ක්‍රියාක්මක කිරීම.
22. ගෙවතු වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සැකසීම.
23. කෘෂිකර්ම අමාත්‍යංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යපෘති වල ප්‍රගතිය ලබා දීමට ප්‍රාදේශීය ලේකම් ට සහ දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂට සහාය ලබාදීම.
24. අමාත්‍යංශයේ වෙබ් අඩවිය සඳහා අවශ්‍යා තොරතුරු සම්පාදනය කිරීම.
25. කෘෂිකර්ම අමාත්‍යංශයේ ලේකම්, දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ හා ප්‍රාදේශීය ලේකම් විසින් අවස්ථානුකූලව පවරනු ලබන රාජකාරී ඉටු කිරීම.